**පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 - 2022**

**--------------------------------------------------------------------------------**

**1. විගණන මතය**

1.1 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 ක 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2023 ජූලි 11 දින වන විට 2022 වර්ෂයට අදාලව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර, එම වාර්තා වල කාරක සභා 02 ක මතය ව්‍යාවනය කර, කාරක සභා 11 ක තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. මතය සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කොමසාරිස්ගේ 2017 පෙබරවාරි 7 දිනැති අංක 15/2016 දරන චක්‍රලේඛයේ කරුණු ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අදාළ කරගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළිබඳ සහතිකයේ හා මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ බව ගොවිජන සේවා කාරක සභා 13 ම විසින් සඳහන් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 07 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි අවශ්‍යතාවයන් සලකා මූල්‍ය ප්‍රකාශනවල එක් එක් දේපල පිරියත හා උපකරණ පන්තිය සම්බන්ධයෙන් පිරිවැය, ප්‍රයෝජනවත් ජීවිත කාලයන් කාලච්ඡේදය ආරම්භයේ හා අවසානයේ සමුච්චිත ක්ෂය හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 02 ක් විසින් වත්කම් මිලදීගන්නා හා විකුණන අවස්ථාවේදී අනුගමනය කරනු ලැබූ ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 08 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි දක්වා ඇති පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායක සැලකිල්ලට ගෙන දේපල පිරියත හා උපකරණවල පිරිවැය වැඩිවීම හඳුනාගත යුතු වුවත්, රු. 5,574,207 ක් වටිනා වත්කම් අත්පත් කර ගැනීම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි අවශ්‍යතාවය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 08 ක් වෙත පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබූ කාබනික පොහොර කැබලි කිරීමේ යන්ත්‍ර වල පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මීට අදාළ තොරතුරු ලබාගෙන නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි අවශ්‍යතාවය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 06 ක සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 747,968 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගනුදෙනු හා සිද්ධීන් ඒවා සිදුවන අවස්ථාවේදී හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 9 හි අවශ්‍යතාවය සලකා තොග සම්බන්ධ සියලුම අලාභයන් එම අලාභයන් සිදුවන කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත යුතු වුවත්, කාරක සභා 06 ක පෙර වර්ෂවලදී කල් ඉකුත් වී තිබූ පිරිවැය රු. 1,328,937 ක් වූ තොග සම්බන්ධයෙන් ඒ පරිදි ගිණුම්ගත කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 7/5/12/ii හා 2022 ජුනි 01 දිනැති ලිපිය අනුව කල් ඉකුත් තොග පොත්වලින් කපාහැරිය බව | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 මගින් හඳුන්වා දී ඇති පරිදි අස්ථිත්වයක මෙහෙයුම් මගින් උපදවන ලද ශුද්ධ මුදල් ප්‍රවාහයේ වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ නිරූපණය කළ යුතු වුවත්, කාරක සභා 04 ක රු. 2,633,353 ක් වූ මෙහෙයුම් මගින් උපදවන ලද මුදල් ප්‍රවාහයන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නිරූපණය කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 හි අවශ්‍යතාවය සලකා කටයුතු කළ යුතුය. |
| (ඊ) | මනම්පිටිය ගොවිජන සේවා කාරක සභාව විසින් එකතු වටිනාකම රු. 1,891,509 ක් වූ බිත්තර වී හා කෘෂි රසායන ආපසු යැවුම් ණයහිමි ගිණුම හර නොකර ගැනුම් ගිණුමට හර කර තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කළ බව | ආපසු යැවුම් ගිණුම බැර කර ණයහිමි ගිණුමට හර කර දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සිරිපුර ගොවිජන සේවා කාරක සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි දක්වා ඇති පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායක සැලකිල්ලට ගෙන ගොඩනැගිල්ල හා සේප්පුවේ පිරිවැය හා වාර්ෂික ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. |
| (ඌ) | සිරිපුර ගොවිජන සේවා කාරක සභාව විසින් රු. 89,605 ක ව්‍යාපෘති අතරුදවුම් මුදල් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | බැදීම්, වගකීම් මූල්‍ය ප්‍රකාශන වල නිරූපණය කළ යුතුය. |
| (එ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් ගිණුම් වර්ෂය අවසානයට ජංගම වත්කම් රු. 335,576 ක් හා ජංගම වගකීම් රු. 134,230 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් හටගත් එකතු වටිනාකම රු. 1,382,023 ක් වූ ගෙවීම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නිරූපණය කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |
| (ඔ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් සියලුම ආදායම් උපචිත ගිණුම්කරණ පදනම මත හඳුනාගනු ලබන බවට මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර තිබුණු නමුත්, මුදලින් ලද ස්ථාවර තැන්පතු පොළී ආදායම් රු. 992,253 ක් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය කර තිබුණි. වාර්තාකරණ කාලච්ඡේදය තුළ උපයාගත් පොළී ආදායම හඳුනාගැනීමට ඊට අදාළ බැංකු ප්‍රකාශන හා පොළී අනුපාත විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගනුදෙනු හා සිද්ධීන් ඒවා සිදුවන අවස්ථාවේ හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඕ) | බකමූණ ගොවිජන සේවා කාරක සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට කාර්යාල උපකරණ වල ශුද්ධ අගය රු.562,780 ක් වුවත්, 2022 ජනවාරි 01 දිනට ශේෂය රු.421,149 ක් ලෙසද, 2021 දෙසැම්බර් 31 දිනට පරිගණක උපාංග වල ශුද්ධ වටිනාකම රු.105,287 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භයට එය රු.131,754 ක් ලෙසද මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | වෙනසට හේතු වූ ගැලපුම් ඉදිරිපත් කළ යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කාරක සභා 02 ක් විසින් ලෙජර් ගිණුම් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා අනුරූපී වාර්තා අනුව ශේෂය අතර එකතු වටිනාකම රු. 637,212 ක නොසැසඳීමක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති අගයන් ඊට අනුරූපව ඇති වාර්තා අනුව සමාන විය යුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බකමූණ ගොවිජන සේවා කාරක සභාවේ 2022 වර්ෂයේ දෙසැම්බර් මස එකතුව රු. 3,375,505 ක් වූ ගෙවීම් වවුචර් 113 ක් සඳහා සහතික කිරීමේ නිලධාරියා (ප්‍රාදේශීය නිලධාරි/ විධායක ලේකම්) විසින් සහතික කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. | විධායක ලේකම් විසින් මේ වන විට ගෙවීම් සහතික කර ඇති බව | මුදල් රෙගුලාසි 138 හි පරිදි කටයුතු කළ යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 06 කට අදාලව ගිණුම් විෂයයන් 06 ක් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති එකතු වටිනාකම රු.77,732,586 ක් සඳහා තහවුරු කිරීමේ ලිපි, ශේෂ සනාථ කිරීම්, අදාල උපලේඛන නොමැතිවීම හේතුවෙන් ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------- | | | |
| | මුදල් රෙගුලාසි 104, 105 | මනම්පිටිය ගොවිජන සේවා කාරක සභාව විසින් රු. 67,832 ක වී තොග ඌණය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණයක් පවත්වා ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ හා ලිපි<br>------------------------ | | | |
| (i) | 1992 අගෝස්තු 3 දිනැති අංක 0439/93 (7/3/5/4) දරණ චක්‍රලේඛය | මනම්පිටිය ගොවිජන සේවා කාරක සභාව විසින් අක්කර බදු ආදායමෙන් සියයට 20 ක ප්‍රමාණයක් ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත යැවිය යුතු රු.164,546 ක් වසර 22 ක කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | ගොවිජන සේවා කොමසාරිස්ගේ 7/5/12/II හා 2022 ජූනි 01 ලිපිය අනුව කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන ගොවිබැංකු චක්‍රලේඛය 4.1 වගන්තිය | බකමූණ ගොවිජන බැංකුවේ 2022 වර්ෂය තුළ රු. 1,591,575 ක් වූ ණය ගෙවීම් ණය පාලන කමිටු සභාපති විසින් අනුමත කර ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී/ ණය පාලන කමිටුවේ ලේකම් විසින් සහතික කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | අදාල අනුමැතීන් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ 2019 අප්‍රේල් 24 දිනැති ගො.සං.මග5/4/පොදු 2019 දරන ලිපිය | ගොවි බැංකුවේ අතරදවාගත හැකි උපරිම මුදල් සීමාව ඉක්මවා ගොවි බැංකු 03 ක අවස්ථා 224 කදී මුදල් අතරදවාගෙන තිබුණි. | විවිධ හේතු නිසා මෙසේ සිදුවූ බවද, එවැනි අවස්ථා පිළිබඳ ඉදිරියේදී සටහන් යෙදීමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 12 ක එකතුව රු. 17,651,062 ක අතිරික්තයක්ද, එක් ගොවිජන සේවා කාරක සභාවක රු. 25,945 ක ඌණතාවයක්ද විය. ඉකුත් වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 12 ක එකතු වටිනාකම රු. 15,540,216 ක අතිරික්තයක්ද, එක් ගොවිජන සේවා කාරක සභාවක රු. 549,288 ක ඌණතාවයක්ද විය.

**2.2 විශ්ලේෂණාත්මක සමාලෝචනය**

**2.2.1 වර්ධනය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාරක සභා 07 ක මූල්‍ය ප්‍රතිඵලය එකතු වටිනාකම රු. 7,560,041 ක වර්ධනයක් තිබුණි. මෙම වර්ධනය සඳහා සහනාධාර යූරියා පොහොර විකුණුම් ආදායම් වැඩිවීම හා ස්ථාවර තැන්පත් පොළී ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**2.2.2 පිරිහීම**

කාරක සභා 06 ක එකතු වටිනාකම රු.4,925,851 ක පිරිහීමක් ද නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට වෙනත් පොහොර ආදායම් අඩුවීම, බිත්තර වී අලෙවි ආදායම් අඩුවීම, වැටුප් හා දීමනා වියදම් වැඩිවීම, ලිපිද්‍රව්‍ය වියදම් වැඩිවීම යන කරුණු ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක පෙර වර්ෂවල මිලදීගෙන තිබූ රු. 1,132,873 ක් වටිනා කෘෂි රසායන, කල් ඉකුත් වී තිබුණි. | නිවැරදි කිරීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | කල් ඉකුත් වූ තොග සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | කාරක සභා 02 ක පොහොර අවභාවිතා කිරීම හේතුවෙන් නිලධාරීන් සිව්දෙනෙකු වෙතින් අයවිය යුතු රු.291,279 ක් අයකර ගෙන නොතිබුණි. | අදාල නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මනම්පිටිය ගොවිජන සේවා කාරක සභාවේ 2018 යල කන්නයේ වගා හානි වෙනුවෙන් ගෙවීම සඳහා වෙන්කරන ලද රු. 3,064,375 අදාළ ගොවීන් වෙත ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ගොවීන් හඳුනාගෙන ගෙවීම් කිරීමට හෝ ආපසු යැවීමට කටයුතු කරන බව | කඩිනමින් නිරවුල් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් 2005 වර්ෂයේ මිලදීගෙන සහල් කර භාරදීමට මෝල් හිමියෙකු වෙත ලබාදුන් වී සඳහා සහල් ලබා නොදීම හේතුවෙන් එම මෝල්හිමියා වෙතින් අයකර ගත යුතු මුදල රු. 1,563,278 ක් විය. | වූදිත මෝල්හිමියා මියගොස් නඩුව වහා තබා ඇත. ගොවිජන සේවා කොමසාරිස්ගේ 7/5/12/ii හා 2022 ජුනි 01 ලිපියේ උපදෙස් පරිදි කටයුතු කර ඇති බව | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | හිඟුරක්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ සාවද්‍ය තොරතුරු ඇතුළත් වවුචර්පත් සකස් කර ගොඩනැගිලි අලුත්වැඩියා කටයුත්තක් සඳහා රු. 176,000 ක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල් වාරික වශයෙන් ගොවිජන සේවා කාරක සභාව වෙත අයවෙමින් පවතින බව | මුදල් රෙගුලාසි 105 හි දක්වා ඇති කරුණු ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | පුලස්තිගම ගොවිජන සේවා කාරක සභාවේ වර්ෂ 5 ක පමණ කාලයක සිට ක්‍රියාකාරී භාවිතයෙන් ඉවත් කර තිබූ ශුද්ධ අගයන් වල එකතුව රු. 247,876 ක් වූ වත්කම් අයිතම 03 ක් පැවතුණි. | ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරන බව | සුදුසු පරිදි කටයුතු කළ යුතුය. |
| (උ) | ගල්අමුණ ගොවිජන සේවා කාරක සභාව විසින් 2021 වර්ෂයේදී රු. 149,445 වැයකර නිෂ්පාදනය කරන ලද පොහොර කි.ග්‍රෑ. 5000 ක් උපයෝජනය කර නොතිබුණි. | කොම්පෝස්ට් සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති වීමෙන් අලෙවි කරගත නොහැකි වූ බව | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) | ගල්අමුණ ගොවිජන සේවා කාරක සභාව විසින් ඉන්වෙන්ට්‍රි ලේඛන වලට ඇතුළත් කර නොතිබූ වී කෙටීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රයක් දිරාපත් වෙමින් පැවතුණි. | ඉන්වෙන්ට්‍රි ලේඛන ගතකර ඇති අතර, අපහරණය සඳහා කටයුතු කරන බව | සුදුසු පරිදි කටයුතු කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිරිතලේ ගොවිජන සේවා කාරක සභාව විසින් පස් පර්යේෂණාගාරයක් ආරම්භ කිරීම සඳහා රු. 486,018 ක් වැය කර මිලදීගෙන තිබූ පස් පර්යේෂණ කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ අයිතම 30 ක් වර්ෂ 18 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | පරීක්ෂණ කටයුතු සඳහා පුහුණුව ලබාගැනීමට ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව | සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**4.** ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන චක්‍රලේඛය පරිදි නියමිත ණය කාලය ඉක්මවන ලද ණය රු. 132,236,768 ක් ගොවීන් 3064 දෙනෙකුගෙන් අයකරගත යුතුව පැවතුණි. | ණයකරුවන් 07 දෙනෙකුගේ ගිවිසුම් අස්ථානගත වී ඇති බව<br>42 දෙනෙකු ගෙවා අවසන් කර ඇති බව<br>206 දෙනෙකුගේ පරීක්ෂණ සිදුකර ඇති බව<br>72 දෙනෙකු අධිකරණයට ඉදිරිපත් කර ඇති බව<br>315 දෙනෙකු විනිශ්චය සභාවට යොමුකර ඇති බව<br>100 දෙනෙකුගෙන් වාරික ලෙස අයවන බව<br>එක් ණයකරුවෙකුගේ ඇපකරුගෙන් | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවි බැංකු නියමු ව්‍යාපෘතියේ ‘‘පෙරමඟ‘‘ ළමා ඉතුරුම් තැන්පත් පවත්වාගෙන යනු ලබන ගොවි බැංකු 06 ක ගිණුම් 293 සිය ආරම්භක තැන්පතුවට සීමා වී තිබුණි. | ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන බව | ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කෙරෙහි විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ගොවි බැංකු 05 ක රු.1,097,023 ක් වූ හිඟ ණය වලට අදාළ ණය ගිවිසුම් අස්ථානගත වීම හේතුවෙන් අයකරගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුවී නොතිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර ඇති බව | අදාල ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පුලස්තිගම ගොවි බැංකු නියමු ව්‍යාපෘතියේ සාමාන්‍ය තැන්පත්කරුවන් 4,588 ක් අතුරින් තැන්පත්කරුවන් 3,663 ක් විසින් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුම්වල ආරම්භක තැන්පතු මුදලේ රැඳී සිටින බව අනාවරණය විය. | ඉතිරි කිරීම් ප්‍රවර්ධනයට කටයුතු කරන බව | ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |